ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සියලු දෙනාම රෝපණය කිරීම සඳහා තම තමන්ට ගෙන ආ හැකි ශාක වර්ග එදිනම තෝරා ගත්හ. මට, මා විසින් රෝපණය කරන ලද මැන්ගුස් පැළ ගැන මතක් විය. අගමැතිතුමා විසින් නිදහස් සැමරුම් දිනක සිටුවන ලද පැළය ගසක් වී, පසුව එහි හටගත් නෑඹුල් ගෙඩි වලින් ලබාගත් බීජ ප්‍රරෝහණය කිරීමෙන් මා ලබාගත් පැළයක් මෙම අවස්ථාව සඳහාද ඉතාම උචිත බව මට මතක් විය.
විවේක ලැබුණු සෑමවිටම, සිසුහු කව්රුත් බීම හෝ පාත්ති සකස් කිරීම, වළවල් කැපීම, පොහොර දැමීම, පැළ ඉනි සිටුවීම, ශාක ආධාරක සකස් කිරීම, පොකුණ සකස් කිරීම වැනි කටයුතු වල නිරත වූහ.
ජනවාරි මාසය අවසන් වීමට ප්‍රථම උද්භිද උයනෙහි සියළුම මූලික කටයුතු අවසන් කිරීමට හැකි විය.

රෝපණය කළ කුඩා මැන්ගුස් පැළය මෙහි රෝපණය කිරීම සඳහා මා විසින් සකස් කර ඇති මැන්ගුස් පැළයක් ගෙන ඒමට මම තීරණය කර ගතිමි. එය සිටුවීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනිමටද මට හැකිවිය. මේ වන විට තාවකාලික භාජන වල වවන ලද නොයෙකුත් උද්භිද වැදගත්කම් වලින් යුක්ත විවිධ ශාක වර්ග සිය ගණනක් විද්‍යාගාරය අසලට ගෙනැවිත් තිබුණි.
රටට නිදහස ලැබී දස වසරක් සැමරීම දී තිබුණු එම වසරේ පෙබරවාරි හතර වන දින, කෙටි උදය රැස්වීමකින් පසු විදුහල්පතිතුමා විසින් මුලින්ම උද්භිද උයනෙහි ඇහැල පැළයක් සිටුවන ලදී. මේ වන විට සෙන්ටිමීටර් දහයක් පමණ උසට වැඩි තිබුණු මගේ මැන්ගුස් පැළයද එයට දකුණු පසින් සිටුවීමට හැකිවිය.

නිදහස් සමරු දින සකස් කරනලද උද්භිද උයන, පොහොර සහ වතුර දැමීම වැනි සැළකිල්ල නිසා ඉක්මණටම ඉතාමත් අලංකාර උද්භිද විද්‍යාත්මක වටිනාකමකින් යුක්ත අධ්‍යයන ස්ථානයක් විය.
ඊළඟ වසර අවසානයේදී උසස්පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසුව මට විදුහලින් ඉවත් වීමට සිදුවිය. විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමට පෙර, දිනක් මගේ මැන්ගුස් පැළය අසලට ගොස් එය හොඳින් දැක බලා ගතිමි.

ඉතා හොඳ සැළකිල්ල නිසා එය මීටර් භාගයක් පමණ උසට, සරුවට වැඩි තිබිණ. ඊළඟ දශක කිහිපය තුළදී රැකියා කටයුතු, විදේශ ගතවීම් ආදිය නිසා විදුහලට යාමට අවස්ථාවක් නොලැබිණ.

1987 වසරේදී විභාග දෙපාර්තමේන්තු රාජකාරි කටයුත්තක් සඳහා මට, විදුහලට යාමට අවස්ථාවක් එළඹිණ. විදුහලේ පරිසරය සම්පූර්ණයෙන් වෙනස් වී ඇත.

විදුහල්පතිතුමාද නවකයෙකි. රාජකාරී කටයුතු අවසන් කිරීමෙන් පසු මම මැංගුස් ගස ගැන තොරතුරු ඔහුගෙන් ඇසීමි.

"මොකද මේ හදිසියේම මැංගුස් ගහක් ගැන අහන්නේ?" ඔහු ඇසීය.

"ඒක දිග කතාවක්. ලැබ් එකට එහා පැත්තේ මැංගුස් ගහ තවම තිබෙනවාද?" මම නැවතත් ඇසීමි.

"තියෙනවා. මේ දිනවල ගෙඩි පිරිලා. ඉතින් මොකක්ද ඒක ගැන තිබෙන දිග කතාව?" ඔහු කුතුහලයකින් යුතුව, නැවතත් මගෙන් ඇසිය.

මම දිග කතාව කෙටියෙන් ඔහුට කීවෙමි. ඔහු පුදුමයට පත්විය. මා විදුහලේ ආදී ශිෂ්‍යයකු බව දැනගත් විට ඔහු මහත් ප්‍රීතියට පත්විය. ටික වෙලාවක් කල්පනා කළ ඔහු,
"හා එහෙනම් ගිහින් තමන් විසින්ම සිටවන ලද ඓතිහාසික ගහ දැක බලාගෙන එන්න" කියා විද්‍යාගාර සහායක සමග මා එතැනට යැවිය.

විදුහල්පති කාර්යාලයේ සිට විද්‍යාගාරය දක්වා, කොරිඩෝව දිගේ යද්දී මා දශක කිහිපයකට ඉහතදී රැඳී සිටි පන්ති කාමර දැකීම ආශ්වාද ජනක විය. ඒවායේ අද වෙන අය ඇත. ඔව්හු වෙනත් ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබති. ඩෙස්ක් පුටු පමණක් ඒවාම විය හැකිය.
ගොඩනැගිලි සහ පන්ති කාමරද වියපත් වී ඇති සැටියක් පෙනේ.
මා විදුහලේ සිටියදි වැඩි කාලයක් ගතකළ විද්‍යාගාර නව මුහුණුවරක් ගෙන ඇත. ඒවා බොහෝදුරට නවීකරණය කර තිබේ.

මා අතීතය ආවර්ජනා කරමින් සිතුවිලි ජාලයක පැටලී සිටින විට විද්‍යාගාර සහායක මට කථාකර,
"සර්, මැන්ගුස් හහ බලන්නට ඕනෑ මොකද? ඒකේ විශේෂ සම්බන්ධයක් තිබෙනවද?" කියා මගෙන් ඇසිය.

**මැන්ගුස් ගස අසලට ගිය මට අදහා ගැනීමට බැරි විය. එය දැන් රූස්ස ගසකි. ගෙඩි වලින් බරවී තිබේ. තව සති කිහිපයකින් ඉදුණු මැංගුස් දස දහස් ගණනක පලදාවක් ලැබෙනු ඇත. මට හරිම සතුටක් දැනුනේය. මම ගස බදාගෙන ටික වෙලාවක් සිටියෙමි. දෑසට කඳුළු උනනු දැනී ඉක්මණටම ඉවත බලා පිසදා ගතිමි.**

මගේ කතාව සැකෙවින් අසා ගත් ඔහු,
"අනේ කොච්චර දෙයක්ද? මම උපදින්නටත් ඉස්සරනේ මේ ගහ සිටවලා තියෙන්නේ. ඒක හිටවපු තැනැත්තාවම දැක ගන්නට ලැබීමත් හරිම වාසනාවක්" යයි කිවේය.

මැන්ගුස් ගස අසලට ගිය මට අදහා ගැනීමට බැරි විය. එය දැන් රූස්ස ගසකි. ගෙඩි වලින් බරවී තිබේ. තව සති කිහිපයකින් ඉදුණු මැංගුස් දස දහස් ගණනක පලදාවක් ලැබෙනු ඇත.
මට හරිම සතුටක් දැනුනේය. මම ගස බදාගෙන ටික වෙලාවක් සිටියෙමි. දෑසට කඳුළු උනනු දැනී ඉක්මණටම ඉවත බලා පිසදා ගතිමි.

එදා අප සකස් කළ උද්භිද උයන අද එහි නැත. එය තණකොළ වැවී ඇති මුඩු බිමකි. එහි එක් කොනක ඝනට වැඩි තිබුණු වැල් ගාලක් වෙත මගේ නෙත් යොමුවුණි. එතනට ගිය මා, වැල් ගොන්න හොඳින් පරික්ෂා කලෙමි. එහි සස්සඳ වැලක් සහ ඔලිඳ වැලක් එකට පැටලී තිබුණු අතර ඒ මත සිරැස්ස ශාකයක්ද හිස ඔසවමින් තිබෙණු දැක්කෙමි. එකට වේලි තිබුණු මෙම වැල් ගොන්න අපි දශක තුනකට කලින් මෙහි සිටවන ලද ශාක වල බීජ හෝ අංකුර වලින් සෑදුනු ඒවාම විය හැකිය. එසේනම්, දිගු කලක් ගත වුවත් මට ඒවාටත් සම්බන්ධයක් තිබිය හැකි නොවේදැයි මට සියුම් හද කිති කවන හැඟීමක් ඇතිවිය. ඒ කාලයේ අප මෙහි උද්භිද උයනක් සකස් කළ ආකාරය විද්‍යාගාර සහායකට මා විස්තර කරමින් සිටින විට ජීව විද්‍යාගාරයේ පන්තියක උගන්වමින් සිටි ගුරු මහත්මියක්ද එතැනට පැමිණියාය.

"මිස්......මේ සර්, මෙහේ ආදී ශිෂ්‍යයෙක්, විභාග දෙපාර්තමේන්තුවෙන් රාජකාරි වැඩකට ඇවිත් තියෙන්නේ. අර මැංගුස් ගහ හිටෙව්වෙත් මේ සර්මලු. ඉස්සර මෙතන බයෝ ගාඩ්න් (Bio Garden) එකකුත් තිබුනලු"
ඔහු මගේ දිග කතාව ගුරු මහත්මියට සැකෙවින් කිවේය.

පැරණි උද්භිද උයන වල් බිහිවී ඇති ආකාරයත් ඉගැන්වීම සඳහා අත්‍යවශ්‍ය එවැනි උයනක් දැනට නොමැති වීම ගැනත්, ඇයට තරමක මදි කමක් දැනෙන්නට ඇත.
"අපි මෙතන බයෝ ගාඩ්න් එකක් හදන්නට සිතාගෙන ඉන්නවා." ඇය කිවේ එපමණකි.

මම ආපසු විදුහල්පති කාර්යාලයට ගියෙමි. විදුහල්පති තුමාගෙන් ලැබුණු තේ කෝප්පයකින් සප්පායම් වූ මට ඔහුගෙන් මා නොසිතූ විරූ කතාවක් අසන්නට ලැබිණ.

"ඔය මැන්ගුස් ගහ ගැන හරියට දෝෂාරෝපණ. ගහෙන් වැටි ළමයි කිහිප දෙනෙක්ම අත පය කඩාගෙන තිබෙනවා. ළමයි ගෙඩි කඩාගැනිමට පොලු ගසා කිහිප වරක්ම විද්‍යාගාරයේ ජනෙල් විදුරු බිඳි තිබෙනවා. ඒ සියල්ලටම වඩා මේ පැත්තේ සිටි දාමරික සොරෙක් පොලිසියෙන් සොයද්දී ඔය ගස මුදුනේ සැඟවී සිට හසුවී, අපටත් වරක් පොලිසි යන්නට සිදු උනා."

මම සාවධානව අසා සිටියෙමි.

"පසුගිය අවුරුදු කිහිපයේ ගහේ ගෙඩි හැදුනේ නැහැ. ගිය අවුරුද්ද මුලදී පැවති තද ඉඩෝර කාලයේදි ගස මැරී යන්නට වගේ ආවා. අපි ගස කපා දැමීමට තීරණය කළා. ඒ උනත් දැනට මාස කිහිපයකට ඉහතදී විශ්‍රාමගත්, විදුහලේ සිටි විද්‍යා ගුරු මහත්මියක්, එයට තරයේ විරුද්ධ වූවා. අද මට අසන්නට ලැබුණු ඔබගේ කතාවට බොහෝ දුරට ආසන්න කතාවක් ඇය අපට කිවා. ඇයද විදුහලේ ආදී ශිෂ්‍යාවක් ඒ නිසාම ගස කපා දම්මේ නැහැ. කොහොම වෙතත් මේ ලගදි සිට ගහ නැවත දළු ලා හොඳින් වැඩි, දැන් ගෙඩි වලින් බරවෙලා. දැන් ඉතින් තොරතුරු හොඳින් දැනගත් නිසා මොන බාධක තිබුනත් ගස කපා දමන්නේ නැහැ."

මම ඔහුට ස්තුති කලෙමි.

වසර හැටකට පමණ ඉහතදී මැංගුස් ගෙඩි තෑගී ලැබුණු අවස්ථාවේ සිට බීජ රෝපණය, උද්භිද උයන සකස් කිරීම, පැළය සිටුවීම ආදී මේ දක්වා සිදුවූ සියල්ල මොහොතකින් සිහි කර, අපට නිදහස ලැබී ගතවූ දෙවන වසරේ සහ දහවන වසරේ පෙබරවාරි හතරවන දිනය අනුස්මරණය කළ අවස්ථා සමග මැන්ගුස් ගසට ඇති වැදගත් ඉතිහාසය විදුහල්පතිතුමාට පැහැදිලි කර දුනිමි.

"මහත්මයාගෙන් අපේ මැන්ගුස් ගසට ලැබුණේ ඉතා හොඳ උප්පැන්න සහතිකයක්" යයි කී විදුහල්පතිතුමා
"මේ සිද්ධිය සෑමදෙනාටම දැනගැනීම සඳහා මම ලබන සඳුදා උදේ රැස්වීමේදී ප්‍රකාශයක් කරනවා." යයි මහත් ආඩම්බරයකින් කිවේය.

ඊළඟ වසරේ (1988) නිදහස් දින සැමරුම් උත්සවය අවස්ථාවේදී විදුහලේ විදුහල්පති තුමා, ගුරු මණ්ඩලය සහ සිසුන් එකතුවී, රෝපණය කර තිස් වසරක් ගතවීම නිමිත්තෙන්, ඵල බරවී තිබුණු මැන්ගුස් ගසට උපහාරයක් කළ බව පසුව දැනගන්නට ලැබිණ. ඒ මැන්ගුස් ගස තවමත් නිරුපද්‍රිතව තිබේනම් 2018 පෙබරවාරි 4 වන දිනට, රෝපණය කර වසර හැටක් සම්පූර්ණ වනු ඇත

